


ගොඩනැගිලි දෙපාර්තමේන්තුව



වාර්ෂික කාර්ය සාධන වාර්තාව- 2025

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 309

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

1.1 හැඳින්වීම 2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 8

1.3 ප්‍රධාන කාර්යයන් 10

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ..... 11

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන /අරමුදල් 12

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... .13

2.1 2025 දක්වා අතීත කාර්ය සාධනය 13

2.2 2025 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය..... 15

2.3 උපදේශක අංශයේ කාර්ය සාධනය 17

පරිච්ඡේදය 03-2025 දෙසැම්බර් 31දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 19

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....19

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....20

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....21

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්.....22

1.පිළියෙල කිරීම් අරමුණ ... .22

2.වාර්තාකරණ කාල පරිච්ඡේදය... 22

3.මිනුම්කරණ පදනම.....22

4.ආදායම් හඳුනා ගැනීම.....22

5.දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම 22

6.දේපළ, පිරියත හා උපකරණ සංචිතය.....22

7.මුදල් හා මුදල් සමාන දෑ.....22

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය.....23

3.6a මූ.රෙ.208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....24

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..... 25

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව** 26

පරිච්ඡේදය 04— කාර්ය සාධන දර්ශක 38

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය 39

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ.....40

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 40

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න..... 40

6.3 මානව සම්පත් කළමනාකරණය 41

පරිච්ඡේදය 07— අනුකූලතා වාර්තාව 45

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 කට වැඩි කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වායත්ත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි .ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකතනය කරයි.

විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වගකියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක 5 කට වැඩි කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය අර්ථ කථනය කරගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම, ශ්‍රම බලකාය අධීක්ෂණය, පාලනය සහ සමාලෝචනය, අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම , කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ ඉංජිනේරුවරුන්, සේවාදායකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට මෙම වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතී. කලාප 7 තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම් වල සහ ප්‍රාග්ධන වියදම් වල සාරාංශය මඟින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම් පිරිවැය ඵලදායි වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයන්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබා දෙයි. උපරිම කාර්යක්ෂමතාවයක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම් අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරනු ලැබේ.

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු කිරීම්වලට අදාල සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

2025 මූල්‍ය වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුලින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුව සමත් විය.

රටෙහි පැවති ආර්ථික අභියෝග හමුවේ හා රජයේ අයවැය යටතේ සීමිත යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන ප්‍රතිපත්ති හමුවේද 2025 වසර තුළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 66% කි.

2024.07.23 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව රැස්වීමේදි තීරණය කල පරිදි සියලුම මධ්‍යම රජයේ රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ආශ්‍රිත ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ගාස්තු උපලේඛනය පදනම් ලෙස භාවිත කිරීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සකස් කර ගැනීමට කටයුතු කරන ලදී.

2025 වසරේදී, අපි අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් හරහා කාරය මණ්ඩල සංවර්ධනය කරගෙන ගියෙමු. තවද, විශ්වවිද්‍යාල හා අනෙකුත් තාක්ෂණික ආයතනවල සිසුන් සඳහා කාර්මික පුහුණු අවස්ථා ලබා දුනෙමු. අපගේ අරමුණ අනාගතයේදී, සියලුම රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම ක්‍රියාත්මක කිරීමයි.

2025 වසර තුළ මුහුණ දුන් බාධකයන්

- කාර්ය මණ්ඩලයේ හිඟකම ඉංජිනේරුවන්, කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්, තාක්ෂණ සහායකයින් හා රියදුරන්ගේ හිඟකම.
- පහසුකම් සහ ප්‍රතිලාභ මද හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම, රජයේ නිලධාරීන් සඳහා වන වැටුප් රහිත නිවාඩු චක්‍රලේඛය අනුව විදෙස්ගත වීම නිසාවෙන් සේවක සංඛ්‍යාව අඩු වීම.
- දැනට පවතින සංචිත වාහන 07න් 02ක් පමණක් ධාවන තත්වයේ පවතින බැවින් වැඩ බිම් වෙත යාම සඳහා වාහන හිඟකම.
- හදිසි ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම් මත වැඩබිම් කාර්ය මණ්ඩල ලබා ගැනීමේ අනුමැතිය නොමැති වීම.
- සංචාරක බංගලා නඩත්තුව/ නගාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා කලමනාකරණ ගාස්තු දෙපාර්තමේන්තුව වෙත නොගෙවීම (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු).
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම.
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත් මදකම නිසා හා සේවාදායකයාගෙන් අරමුදල් නොමැතිකම මත කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව.
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්.

බාධක ජය ගැනීමට යොදන ලද උපක්‍රම

- පවතින කාර්ය මණ්ඩලයෙන් රාජකාරී ආවරණ හා වැඩ බැලීම් පදනම් යටතේ රාජකාරී කටයුතු කරගෙන යාමට පියවර ගැනීම හා අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කර මානව සම්පත් කළමනාකරණය කිරීම
- සේවාදායකයාගෙන් අවශ්‍යතා ලබා ගැනීම, ආරම්භක අදියරේදී එක්එක් සේවා ගණුයේ නිළධාරීන් කණ්ඩායමක් ලෙස සිදු කිරීම.
- සේවාදායකයා සම්බන්ධීකරණය කර ඇස්තමේන්තු අනුමැතිය ලබා ගැනීම.
- දුර්වල කාර්ය සාධනයක් ඇති කොන්ත්‍රාත්කරුවන් ඉවත් කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම් මගින් කාර්ය මණ්ඩලයේ මනස වෙනස් කිරීම.

ඉංජි.ඩබ්.ආර්.එන්.ආර්. ප්‍රේමවන්ද්‍ර


ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්

කළමනාකාරීත්ව - ධුරාවලිය

ඉංජි.ඩබ්.ආර්.එන්.ආර්.ප්‍රේමචන්ද්‍ර මෙනවිය	අධ්‍යක්ෂ ජනරාල්
ඉංජි. එස්.එස්.රන්වත්ත මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා - රා.ආ.)
වාස්තු විද්‍යාඥ කේ.බී.මේනක මංගලනාථ මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා)
ඉංජි. කේ.ඉලංකෝ මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1)
ඉංජි. ඒ.එම්.වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 2)
ඉංජි. ජී.එච්.ඒ.බී.සජෝත මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3)
ඉජි. එච්.එම්.ආර්.බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන)
-පුරප්පාඩුව පවති-	අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ)
ඉංජි .ඩබ්.එන්.අජන්තා මහත්මිය	අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)
වාස්තුවිද්‍යාඥ ආර්.ඒ.ටී.එස්.රණතුංග මහත්මිය	අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)
එස්.ඩී.ඩී.පී.සිංහපුර මහත්මිය	අධ්‍යක්ෂ (පාලන)
කේ.කේ.අනිල් කන්නන්ගර මහතා	ප්‍රධාන ගණකාධිකාරී
කේ.ජී.බී. ප්‍රියන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක

සංස්ථානික තොරතුරු

නම	-	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
නෛතික තත්ත්වය	-	පූර්ණ රාජ්‍ය ආයතනයකි
අමාත්‍යාංශය	-	නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	-	දෙවන මහල "සෙත්සිරිපාය", බත්තරමුල්ල ශ්‍රී ලංකාව දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 විද්‍යුත් තැපෑල info@buildingsdept.gov.lk අන්තර්ජාල ලිපිනය www.buildings.gov.lk




රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම

කලාප කාර්යාල

කලාප කාර්යාලය	ලිපිනය
කලාප 1 (බස්නාහිර උතුර)	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1- බස්නාහිර උතුර) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො. 213, ටොරින්ටන් පෙදෙස, කොළඹ 07
කලාප 1 (බස්නාහිර දකුණ)	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1- බස්නාහිර දකුණ) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො. 213, ටොරින්ටන් පෙදෙස, කොළඹ 07
කලාප 2	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 2) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, වෙරළ පාර, ගුරුනගර්, යාපනය
කලාප 3	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 3) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, විල්ගොඩ පාර, කුරුණෑගල
කලාප 4	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 4) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, පනිච්චායඩි, තිරෙමඩු, මඩකලපුව
කලාප 5	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 5) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 113, මහනුවර
කලාප 6	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 6) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො.10, ඉහල ඩික්සන් මාවත, ගාල්ල.

කලාප බෙදීමේ සිතියම



රූපය 2: කලාප බෙදීමේ සිතියම

සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවාදායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති වෙන තාක්ෂණික දැනුමේ පරතරයපිරවීමට කටයුතු කරයි.

ව්‍යාපෘති යෝජනා (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

කාර්ය නිෂ්ඨාව (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය අනුමැතිය දීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක්පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් මාරු කෙරේ.

උපදේශනය (විධායක කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛනකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණය (විධායක/උපදේශන ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

උපදේශන හා කොන්ත්‍රාත් ආයතන කලමනාකරණය කිරීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. රජයේ හෝ පරිත්‍යාගශීලීන්ගේ ආයතන විසින් සිදු කරනු ලබන පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන්, BOT, BOOT, සැලසුම් කිරීම හා ඉදිකිරීම් ව්‍යාපෘති අප විසින් භාරගනු ලැබේ. මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්යභාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)

තත්ත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය.

ලබාදෙන වෙනත් සේවාවන්

අනෙක් ආයතනවල ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු, ස්ථාවර තාක්ෂණික කමිටු, අනුකමිටු සහ අනෙකුත් අදාල කමිටු සඳහා අත්දැකීම් ඇති තාක්ෂණික නිලධාරීන් සාමාජිකයින් ලෙස පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

තවද, ගොඩනැඟිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා මිල ගණන් සාරාංශ (ගොඩනැගිලි ගාස්තු උපලේඛනය)කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

අපගේ බැඳියාවන් සමඟ වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම , ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
5. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
6. අනෙකුත් අර්ධ රාජ්‍ය ආයතන සඳහා තාක්ෂණ සහාය ලබාදීම
7. විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක සහ අනෙකුත් තාක්ෂණික ආයතන වල ශිෂ්‍යයන් සඳහා පුහුණු පහසුකම් සැපයීම
8. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තුල සහ අනෙකුත් බාහිර දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරුවන්ට වරලත් ඉංජිනේරු තත්වය ලබා ගැනීමට සැලසුම් කාර්යාල පුහුණු පහසුකම් සැපයීම
9. ගොඩනැගිලි ගාස්තු උපලේඛනය ***(BSR)*** සැකසීම හා යාවත්කාලීන කිරීම

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ප්‍රධාන කාර්යාලය

1. උපදේශන සේවා අංශය
   - වාස්තු විද්‍යාඥ සේවා අංශය
   - ව්‍යුහාත්මක අංශය
   - විදුලි අංශය
   - ජල සැපයු හා පල්දෝරු අංශය
   - යාන්ත්‍රික ඉංජිනේරු අංශය
   - ඇස්තමේන්තු අංශය

1. ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන අංශය
   - සැලසුම් අංශය
   - කලමනාකරණ සංවර්ධන අංශය
   - කොන්ත්‍රාත් අංශය
2. පාලන අංශය
3. මුදල් අංශය
4. අභ්‍යන්තර විගණන අංශය

කලාප කාර්යාල

5. කලාප කාර්යාල
   - බස්නාහිර උතුර
   - බස්නාහිර දකුණ
   - කලාප 02 -යාපනය
   - කලාප 03 - කුරුණෑගල
   - කලාප 04 - මඩකලපුව
   - කලාප 05 - නුවර
   - කලාප 06 - ගාල්ල


1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආයතන ප්‍රධානී, ප්‍රධාන පරිපාලන නිලධාරි/ පරිපාලන නිලධාරී විසින් අත්සන් කළ යුතු විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත අරමුණු කෙටියෙන් විස්තර කිරීම.

2.1 2025 දක්වා අතීත කාර්ය සාධනය




	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024	2025
Rehabilitation	603.43	502.77	446.62	283.49	278.61	493.71	59.92	59.27	1003.04	1518.46
New Buildings	3313.95	4759.63	4886.74	4527.99	1672.08	2417.96	2116.12	1555.15	1689.90	2252.05
Total	3917.38	5262.40	5333.36	4811.48	1950.69	2911.67	2176.04	1614.42	2692.94	3770.51

රූපය 3: 2025 වසර දක්වා අතීත කාර්ය සාධනය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාව නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ලෙස වර්ග කළ හැක. වගුව 1 සහ රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය 2016 වර්ෂයේ රු. මිලියන 3917.38 සිට උච්චාවචනයන්ට ලක්වීම සිදු වූ අතර 2025 වර්ෂයේදී කාර්ය සාධනය රු. මිලියන 3770.51 විය. තවද 2024 සිට 2025 දක්වා කාර්ය සාධනය 40% කින් වැඩි වී ඇත.

වගුව 1: වාර්ෂික වැඩිවීම 2016-2025

වසර	වාර්ෂික කාර්ය සාධනය	වර්ධනය %	වර්ධනය %
	රුපියල් මිලියන	(පදනම් වර්ෂය 2016)	(පදනම් වර්ෂය පෙර වසර)
2016	3917.38		
2017	5262.40	34	34
2018	5333.36	36	1
2019	4811.48	23	-10
2020	1950.69	-50	-59
2021	2911.67	-26	49
2022	2176.04	-44	-25
2023	1614.42	-59	-26
2024	2692.94	-31	67
2025	3770.51	-4	40



රූපය 4: කාර්ය සාධනයේ වර්ධනය


2024 සිට 2025 දක්වා දෙපාර්තමේන්තුව, 1 වගුවේ පෙන්වා ඇති පරිදි, නඩත්තු හා වැඩි දියුණු කිරීම් කාර්ය සාධනය රු.මිලියන 2692.94 සිට රු.3770.51 මිලියන දක්වා වැඩි වී ඇත.

පහත වගුව 2 , නඩත්තු හා වැඩි දියුණු කිරීම් සහ නව ගොඩනැගිලිවල කාර්ය සාධනය පෙන්වයි. 2024 සිට 2025 දක්වා නව ඉදිකිරීම් කාර්ය සාධනය 33 % කින් වැඩි වූ අතර නඩත්තු හා වැඩි දියුණු කිරීම් 51% කින් වැඩි විය. සමස්ත ප්‍රගතිය 40% වැඩි වී ඇත.

වගුව 2: වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සංසන්දනය

අංශය	කාර්ය සාධනය (රු.මිලියන)		වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර)
	2024	2025	
නඩත්තු හා වැඩි දියුණු කිරීම්	1003.04	1518.46	51%
නව ඉදිකිරීම්	1689.90	2252.05	33%
එකතුව	**2692.94**	**3770.51**	**40%**

2.2 2025 වසරේ ව්‍යාපෘතිවල ප්‍රගතිය



	Jan	Feb	March	April	May	June	July	Aug	Sep	Oct	Nov	Dec
2025 Target	426.28	1020.41	1695.17	1729.71	2195.21	2663.22	2674.32	3138.36	3617.65	3566.03	4264.64	5693.75
2025 Progress	7.45	126.47	383.28	662.84	903.1	1046.73	1147.81	1512.54	1700.69	1936.05	2216.12	3770.51

රූපය 5- 2025 වසරේ ඉලක්ක සහ ප්‍රගතිය සංසන්දනය

දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේදී ව්‍යාපෘති 283 ක් හසුරුවා ඇති අතර එයින් ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 දක්වා වූ ව්‍යාපෘති 194 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 සිට මිලියන 100 දක්වා ව්‍යාපෘති 62 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 100 සිට 200 දක්වා ව්‍යාපෘති 12 කි. ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 200 ට වඩා වැඩි ව්‍යාපෘති 15 ක් ඇත.

වගුව 3: 2025 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය

කලාප කාර්යාලය	ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන)				
	0 - 25	25 - 100	100 - 200	> 200	එකතුව
බස්නාහිර/ දකුණ	17	09	02	04	**32**
බස්නාහිර/ උතුර	37	13	03	02	**55**
කලාප 2	23	09	01	02	**35**
කලාප 3	20	08	01	00	**29**
කලාප 4	53	08	00	01	**62**
කලාප 5	22	09	03	01	**35**
කලාප 6	22	06	02	05	**35**
එකතුව	**194**	**62**	**12**	**15**	**283**

තවද , අනෙකුත් ආයතන වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වූ ඇස්තමේන්තු ලබා දීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් සිදු කරනු ලැබුණි. 2025 වර්ෂය සඳහා රු.මිලියන 19,853.52 ක පමණ ඇස්තමේන්තු සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත. ඇස්තමේන්තු අනුමත වීමෙන් පසු ප්‍රතිපාදන ලබා ප්‍රසම්ප්‍රාදන කටයුතු සිදු කිරීමට නියමිතය. සේවාදායක ආයතන ඇස්තමේන්තු අනුමත නොවී තිබූ අතර අනුමත වූ පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය (වගුව 4 හි සඳහන් වේ).

වගුව 4: 2025 වසරේදී සේවාදායකයන් සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු

කලාප කාර්යාලය	2025 වසරේ ඉදිරිපත් කල ඇස්තමේන්තු	ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන)
කලාප 01 - බස්නාහිර දකුණ	92	6,556.56
කලාප 01 - බස්නාහිර උතුර	89	1,499.07
කලාප 02	66	3,342.45
කලාප 03	34	1,294.89
කලාප 04	70	3,622.20
කලාප 05	87	2,169.60
කලාප 06	57	1,368.75
එකතුව	**495**	**19,853.52**

2.3 උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන්හි මූලික අංශය වන්නේ උපදේශන අංශයයි. මෙම යටිතල පහසුකම් සම්බන්ධ වාස්තු විද්‍යාත්මක අංශය ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත, ව්‍යුහාත්මක, විදුලි, ජල සම්පාදන හා පල්දෝරු, යාන්ත්‍රික සැලසුම් සහ ප්‍රමාණ බිල්පත් යන ආකාරයෙන් නිර්මාණ සේවා සපයයි. ඉහත සේවාවන් සපයනු ලබන්නේ කැපවූ වෘත්තීය ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් විසිනි. 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා උපදේශන අංශයේ කාර්ය සාධනය දළ සැලසුම් නිර්මාණ, සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ හා ප්‍රමාණ බිල්පත් සකස් කිරීම වශයෙන් වගුව 5 මගින් දක්වකි.

වගුව 5: උපදේශන අංශයේ කාර්ය සාධනය

		2021	2022	2023	2024	2025
වාස්තුවිද්‍යා අංශයේ කාර්ය සාධනය						
දළ සැලසුම් නිර්මාණ	ඉලක්කය	67	19	38	78	78
	ප්‍රගතිය	61	18	34	62	72
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	55	21	14	28	40
	ප්‍රගතිය	40	14	12	24	37
ව්‍යුහාත්මක ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය						
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	40	19	28	30	21
	ප්‍රගතිය	42	14	12	15	21
ජල සම්පාදන හා මලාපවහන ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය						
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	56	21	20	20	24
	ප්‍රගතිය	52	18	14	20	23
විදුලි ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය						
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	64	21	17	14	56
	ප්‍රගතිය	63	21	17	14	56
යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය						
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	61	24	13	25	28
	ප්‍රගතිය	61	24	13	25	28
ඇස්තමේන්තු අංශයේ කාර්ය සාධනය						
ප්‍රමාණ බිල්පත් සකස් කිරීම	ඉලක්කය	26	13	7	3	60
	ප්‍රගතිය	29	10	4	3	65
ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු සැකසීම - 2025 වර්ෂය						14

2025 වර්ෂයේ උපදේශන අංශයේ කාර්ය සාධනය නඩත්තු, තාක්ෂණික වාර්තා හා වෙනත් වශයෙන් වගුව 6 මගින් දක්වති.

වගුව 6: 2025 වර්ෂයේ උපදේශන අංශයේ කාර්ය සාධනය - තාක්ෂණික වාර්තා හා වෙනත්

අංශය	තාක්ෂණික වාර්තා	නඩත්තු හා වෙනත් කටයුතු සඳහා සැලසුම් නිර්මාණ
ව්‍යුහාත්මක ඉංජිනේරු අංශය	60	47
ජල සම්පාදන හා පල්දෝරු අංශය	08	-
විදුලි ඉංජිනේරු අංශය	32	-
යාන්ත්‍රික ඉංජිනේරු අංශය	27	-
ඇස්තමේන්තු අංශය	-	-
එකතුව	**127**	**47**

පරිච්ඡේදය 03 - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

එසිජ්-එල්

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තක්සේරු 2025 රු.	2024 රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ආනයන්කර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වරකාර්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර ණුම්බි		2,299,620,000	1,710,808,000	එසිජ්-3
-	බැන්ඳුම		641,570,067	729,237,637	එසිජ්-4
-	අන්තිකාරම් ගිණුම්		25,399,812	23,607,299	එසිජ්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		1,643,029	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		2,968,232,909	2,463,652,936	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		2,968,232,909	2,463,652,936	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		101,331,378	258,000,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		2,866,901,530	2,205,652,936	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
465,178,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	459,600,394	405,430,061	
170,437,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	164,212,295	166,310,558	එසිජ්-2(ii)
2,085,000	සභානාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,336,765	1,686,450	
-	පොළී ගෙවීම්	8	-	-	
300,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	66,250	52,500	
638,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		625,215,705	573,479,569	
	මූලධන වියදම්				
56,700,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	56,602,668	13,746,550	
18,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	18,268,466	5,904,977	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,374,910	නැකියා විධිනය	14	1,356,285	900,000	
625,090	වෙනත් මූලධන වියදම්	15	625,090	-	
77,000,000	**මුළු මූලධන වියදම් (උ)**		76,852,509	20,551,527	
	කැන්පතු ගෙවීම්		707,616,029	819,078,750	එසිජ්-4
	අන්තිකාරම් ගෙවීම්		28,062,712	26,739,931	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		735,678,741	845,818,681	
	මුළු වියදම් ට = (ඊ+උ+ඌ)		1,437,746,955	1,439,849,777	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)**		1,429,154,575	765,803,159	
	අවුරුදු ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		1,429,154,575	764,038,537	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අවුරුදු ශේෂය		-	1,764,622	එසිජ්-3
				-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒඕස්-ඉ

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඕස්-6	1,134,411,368	872,812,849
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම	ඒඕස්-5/5(ඒ)	69,665,413	67,002,513
මුදල් හා මුදල් සමාන දෑ	ඒඕස්-3	-	-
මුළු වත්කම්		**1,204,076,781**	**939,815,362**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(415,569,333)	(486,042,816)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,134,411,368	872,812,849
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඕස්-5(ඕ)	-	-
		-	-
ප්‍රංශම වගකීම්		-	-
		-	-
නැන්පතු ගිණුම්	ඒඕස්-4	485,234,746	551,280,707
අග්‍රිම ශේෂය	ඒඕස්-3	-	1,764,622
මුළු වගකීම්		**1,204,076,781**	**939,815,362**

පිටු අංක **01** සිට **36** දක්වා ඒඕස් 1 සිට ඒඕස් 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **37** සිට **77** දක්වා ඇතුළත් ගිණුම් සටහන් වශයෙන් ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සිදුකෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් යොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන මහඇණ පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 2026/02/24	දිනය : 2026.02.23

Eng. L. B. Kumudu Lal
Secretary
Ministry of Housing, Construction & Water Supply
12th Floor, "Sethsiripaya"

Eng. W.R.N.R. Premachandra
Director General of Buildings
Department of Buildings
"Sethsiripaya"
Battaramulla

කේ. කේ. අමිල් කන්නන්ගර
ප්‍රධාන ගණකාධිකාරි
නොගිනුම්හිමි දෙපාර්තමේන්තුව
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

ඒසිල්-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලාභය	-	-
පොළිය, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභාංශ	-	-
ආදායම් නොවන ලැබීම්	1,643,029	-
වෙනත් ආදායම් කිරීම් වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	217,196,027	280,688,300
අමිලම් ලැබීම්	2,299,620,000	1,710,808,000
අත්තිකාරම් අයකරගැනීම්	25,430,759	22,465,620
තැන්පතු ලැබීම්	641,570,067	729,237,637
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,185,459,883	2,743,199,557
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	622,370,965	569,621,194
ගබඩාධාර සහ මාරුකිරීම්	1,316,765	1,686,450
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	58,584,043	-
වෙනත් වැය කිරීම් වෙතුවෙන් දරන ලද වියදම්	1,647,588,214	1,045,683,687
භාණ්ඩාගාරයට පියවන ලද අමිලම්	101,331,378	258,000,000
අත්තිකාරම් ගෙවීම්	28,364,022	26,813,327
තැන්පතු ගෙවීම්	707,616,029	819,078,750
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	3,167,191,416	2,720,883,408
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	18,268,466	22,316,149
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිශ්චිතම ඉවත්කිරීම් ප්‍රතිපාදන හා තෙහෙතික වත්කම් විකිණීම්	-	-
උපාය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	18,268,466	20,551,527
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	18,268,466	20,551,527
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(18,268,466)	(20,551,527)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	1,764,622
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	1,764,622
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. <u>පිළියෙල කිරීම් අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2. <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3. <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5. දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගැනීම සහ මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6. දේපළ, පිරියත සහ උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ , පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7. මුදල් සහ මුදල් සමාන දේ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවලදී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තා කිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.
- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතුය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000.....

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ප්‍රතිපාදන (රු.)		තක්සේරු වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්ථන	640,000,000.00	638,000,000.00	625,215,704.73	98.00 %
ප්‍රාග්ධන	75,000,000.00	77,000,000.00	76,852,509.30	99.81 %

3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අංකය	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ව්‍යාපෘති ගණන	ලැබුණු අරමුදල් 2025 (ශුද්ධ)	31-12-2025 දිනට මුලු වියදම	ඉතුරු මුදල (රු.)	ප්‍රගතිය (% ලෙස)
1	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	51	391,097,892.57	391,097,892.57	-	100
2	පොලිස් දෙපාර්තමේන්තුව	26	582,254,887.43	582,254,887.43	-	100
3	ආයුර්වේද දෙපාර්තමේන්තුව	16	190,223,175.04	190,223,175.04	-	100
4	කැපැල් දෙපාර්තමේන්තුව	13	116,637,505.07	116,637,505.07	-	100
5	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	10	76,584,018.80	76,584,018.80		100
6	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	08	10,268,932.65	10,268,932.65	-	100
7	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	06	24,210,837.69	24,210,837.69	-	100
8	මැතිවරණ කොමිසම	06	55,600,776.13	55,600,776.13	-	100
9	අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය	05	71,997,794.66	71,997,794.66	-	100
10	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	04	26,967,906.44	26,967,906.44	-	100
11	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	03	4,736,424.59	4,736,424.59	-	100
12	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	02	4,237,097.40	4,237,097.40	-	100
13	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	02	1,284,406.02	1,284,406.02	-	100
14	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව	02	11,815,370.28	11,815,370.28	-	100
15	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	02	1,153,044.05	1,153,044.05	-	100
16	කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	02	14,498,694.56	14,498,694.56	-	100
17	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	02	2,407,813.38	2,407,813.38	-	100
18	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	01	3,000,000.00	3,000,000.00	-	100
19	සුරාබදු දෙපාර්තමේන්තුව	01	393,713.31	393,713.31	-	100
20	කම්කරු දෙපාර්තමේන්තුව	01	720,514.12	720,514.12	-	100
21	සමාජ සේවා දෙපාර්තමේන්තුව	01	17,999,977.17	17,999,977.17	-	100
22	රෙදිපිළි කර්මාන්ත දෙපාර්තමේන්තුව	01	12,968,730.80	12,968,730.80	-	100

අංකය	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ව්‍යාපෘති ගණන	ලැබුණු අරමුදල් 2025 (ශුද්ධ)	31-12-2025 දිනට මුලු වියදම	ඉතුරු මුදල (රු.)	ප්‍රගතිය (% ලෙස)
23	ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය	01	12,599,999.99	12,599,999.99	-	100
24	අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය	01	9,500,000.00	9,500,000.00	-	100
25	රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	01	750,356.06	750,356.06	-	100
26	නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය	01	153,444.00	153,444.00	-	100
27	ශ්‍රී ලංකා රේගුව	01	178,999.27	178,999.27	-	100
එකතුව		**170**	**1,644,242,311.48**	**1,644,242,311.48**		

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 2025.12.31 දිනට (රු.)	2025.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාවේ ශේෂය (රු.)	ගණනය කිරීමට නියමිත	ප්‍රගති වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	168,802,830.71	168,802,830.71	-	100
9152	යන්ත්‍රෝපකරණ	286,052,741.67	286,052,741.67	-	100
9153	ඉඩම්	664,319,399.78	664,319,399.78	-	100
9154	අස්පෘෂ්‍යාය වත්කම්	15,236,396.22	15,236,396.22	-	100
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.8 **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඒඊ/ඒ/බීඩී/එෆ්එස්/02/2025/01 ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2026 මැයි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඝටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඝටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා වංචා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිලිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිලිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

දෙපාර්තමේන්තුව සතු හෙක්ටයාර 3.53 ක ඉඩම් 16 ක් හා වර්ග අඩි 64,054.31 ක ගොඩනැගිලි 37 ක් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ACA-6 / SA-82 ආකෘතීන් හි පෙන්නුම් කරන ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම නිවැරදි නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

ලේඛණ වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන	යාවත්කාලීන කර නොතිබුණි.
විදුලි උපකරණ ලේඛනය	මුදල් රෙගුලාසි 454 (2) හි විධිවිධාන	ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව කටයුතු කිරීමෙන් වැය විෂයයන් 01 ක සියයට 100 ක් හා වැය විෂයයන් 03 ක සියයට 61 සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක ඉතිරිවීම් වලට හේතූන් ලෙස දක්වා තිබූ, සමාලෝචිත වර්ෂයේ බැරකම් පියවීම සඳහා වෙන් කිරීම, වෙනත් කාර්යාල වලට නිලධාරීන් මාරුවීම සහ රජය විසින් දේපල ණය ලබා දීම නවතා තිබීම ආදී කරුණු විගණනයේදී පිළිගත නොහැකි විය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල 03 ක වැය විෂයයන් 05 කට අදාළව පැවති රු.283,198 ක බැරකම් දක්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තු වල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳි සිටිය යුතු වුවද නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීමෙන් වැය විෂයය අංක 309-1-1-1402 හි ප්‍රතිපාදන ඉතිරිව නොතිබියදී රු.44,819 ක් හා වැය විෂයය අංක 309-2-2-1301 හි ප්‍රතිපාදනය ඉක්මවා රු.34,766 ක බැරකම් වලට එළඹ තිබුණි.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත වසර 05 කට පෙර ලබා දී තිබූ රු.මිලියන 3,058 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 ක වැඩ 2022 හා 2025 වර්ෂවලදී නිම කළ යුතු වුවද එම කොන්ත්‍රාත් කාර්යයන්හි සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික ප්‍රගතිය සියයට 20 ත් 75 ත් අතර පරාසයක පැවතුණි. එසේම එහි වියදම රු.මිලියන1,188 ක් වී තිබුණි.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 1645	පවත්වා ගතයුතු වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) 2016 දෙසැම්බර් **29** දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද ඒ අනුව දෙපාර්තමේන්තුව සතු වාහන 09 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

3.6 තැන්පතු

(අ) මූ.රෙ.571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියලු තැන්පත් පිළිබඳ ලැයිස්තු පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මූ.රෙ. 571(2) ප්‍රකාරව ඉකුත් වූ සියලු තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් අංක 6000-0-0-16-033 දරන තැන්පතු ගිණුමට අදාළ 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ රු. මිලියන 55.80 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) මූ.රෙ. 571(3) ප්‍රකාරව තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට, රජයේ ආදායමට බැර කිරීමට හෝ නැතහොත් හැකි ඉක්මනින් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවත් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා තැන්පතු වශයෙන් 2020 වර්ෂයේ ලැබී තිබූ රු. මිලියන 5.18 ක් හා 2022 වර්ෂයේ ලැබී තිබූ රු. මිලියන 14.25 ක මුදලක් ඉහත පරිදි කටයුතු නොකර දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

4.1.1. දැක්ම හා මෙහෙවර

තාක්ෂණික වගකීම අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව, පිරිමැසුම්දායක බව, ගුණාත්මක භාවය, සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි එසේම තත්කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික, නඩත්තු කිරීම්, උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවන් සැපයීම, දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර තුළ ඇතුලත් වූ අතර මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2025 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 57 කින්ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 12 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන් හා තාක්ෂණික නිලධාරීන් 96 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුයුක්තව සිටියද කාර්යසාධනය පහත සඳහන් පරිදි දුර්වල තත්ත්වයක පැවතුණි.

(අ) දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම.

2018 අගෝස්තු 15 දිනැති 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි 3.(3)(1) උපවගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ ලියාපදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ප්‍රකාශයක් එම සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. මෙම පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු බව පනතෙහි 2 වන වගන්තිය මඟින් නිශ්චිතව දක්වා තිබුණු අතර 2023 අගෝස්තු 18 දින වන විට එම කාල සීමාව අවසන් වී තිබුණි. ඒ කාල සීමාව තුළදී නිසි පරිදි සම්බන්ධීකරණය කර නොගැනීම හේතුවෙන් සහාධිපත්‍ය දේපල ලියාපදිංචිය සඳහා ලැබී තිබූ ඉල්ලුම්පත් 50 ක් සඳහා වාර්තා ලබා දීමට මේ දක්වා නොහැකි වී තිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගත් ඉදිකිරීම් ව්‍යාපෘති

i. මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රය සංක්‍රමණ නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය

මඩු වන්දනා සමය සඳහා පැමිණෙන බැතිමතුන් හට අඩු පිරිවැයකට ඉන්දියානු රජයේ ආධාර යටතේ නිවාස 300 ක් ඉදි කිරීම සඳහා 2018 නොවැම්බර් 15 දින රු.මිලියන 400 ක් ලැබී තිබුණු අතර ව්‍යාපෘතියේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පත්කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ සේවාලාභී වන සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සමඟ අත්සන් කොට තිබුණු අවබෝධතා ගිවිසුම අනුව පූර්ණකාලීනව යෙදවිය යුතු කාර්යමණ්ඩලය, අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ හා ශ්‍රමය ප්‍රමාණවත් පරිදි යොදා නොගැනීමෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එකඟ වූ පරිදි ව්‍යාපෘතිය නිම කර දීමට නොහැකි වූ අතර 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 53 ක් හා සියයට 66 ක් පමණක් විය.

ii. තල් කර්මාන්තය විවිධාංගීකරණය කරමින් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට තල් ආදර්ශ ගොවිපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 23 ක් වූ මෙම ව්‍යාපෘතියේ උපදේශන ආයතනය ලෙස 2021 මාර්තු 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තෝරාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතියේ

කොන්ත්‍රාත්කරු 2022 ජූලි 12 දින සිට ඉදිකිරීම් අතහැර දමා තිබුණු අතර 2022 අගෝස්තු 15 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 30 ක් ද සහතික කල වැඩ වටිනාකම රු. මිලියන 4.96 ක් ව තිබූ බවත් නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තු වන බව අංක 2-3-14-382 හා 2022 ඔක්තෝබර් 19 දිනැති ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ට දන්වා තිබුණි. එසේ වුවද මේ දක්වා ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර නොතිබුණු බැවින් ව්‍යාපෘති සඳහා දරා ඇති මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

iii. **කොළඹ නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතිය**

කැබිනට් පත්‍රිකා අංක 16/1676/702/003-XXVII සහ 2016 අගෝස්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 10/08/2016/10 මඟින් ශ්‍රී ලංකා පොලිසියේ ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිවලින් නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. ඉදිකිරීම් සඳහා වූ මුළු ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 376.59 ක් විය. ජාතික තරහකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මත මෙහි ප්‍රසම්පාදනය කටයුතු සිදු කොට තිබුණු අතර එක් කොන්ත්‍රාත් ආයතනයක් පමණක් රු. මිලියන 416.59 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව එම කොන්ත්‍රාත්කරු සමග ඉදිකිරීම් කරගෙන යාමේදී ඉදිකිරීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු බංකලොත්භාවයට පත්වීමෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබූ අතර ඒ වන විට මූල්‍ය ප්‍රගතිය සියයට 35 ක් හා භෞතික ප්‍රගතිය සියයට 46 ක්ව පැවතුණි. නව කොන්ත්‍රාත්කරුවකු වෙත ඉදිකිරීම් ව්‍යාපෘතිය ප්‍රදානය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) **රාජ්‍ය ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම**

ඉදිකිරීම් කටයුතුවල නිරත නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වැනි රාජ්‍ය ආයතන කිහිපයක්ම පවතින බැවින් හා එම කාර්යයන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින්ද සිදු කරන බැවින් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති වෙනස් කිරීම පිළිබඳ හැකියාව සොයා බලන ලෙස 2014 සැප්තැම්බර් මස 14 වන දින පවත්වන ලද රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග අංක 10 මඟින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් කිරීම සඳහා වූ යෝජනාවලියක් එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතු සම්පත් වඩාත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් සහ දෙපාර්තමේන්තුවේ අධිකාරි බල සීමා පුළුල් කර ගනිමින් ජාතික නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය ඉහළ නංවීම අරමුණු කර ගනිමින් සේවාවන් පුද්ගලික අංශය වෙතද ව්‍යාප්ත කිරීම, දේශීය මෙන්ම විදේශීය ආයෝජකයන් හට ද එකී සේවාවන් ලබා

ගැනීමට අවස්ථාව සැලසීම හා ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහයද ලබාගෙන විදෙස් ව්‍යාපෘතිවල නිර්මාණ කටයුතු ඉටු කිරීම යන යෝජනා හා නිර්දේශ ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර 2022 නොවැම්බර් මස 01 දින අනුමැතිය ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තු කාර්යභාරය පුළුල් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර වාර්ෂික මුල්‍ය ප්‍රකාශනය සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව සතු දියතලාව ඉඩම ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇති අතර ඒ වෙනුවට හපුතලේ ඉබ්බන්ආර ප්‍රදේශයේ ඉඩමක් ලබාදීමට නියමිත බව දැන්වූවත් ඔප්පු ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පිහිටි අක්කර 01 පර්චස් 21 ක් වූ ආරුගම්බේ ඉඩම 2004 වර්ෂයේ සිට කිසිදු කටයුත්තක් සඳහා භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් කොළඹ පිහිටි නිල නිවාසයක් සහ තක්සේරු වටිනාකම රු.මිලියන17.4 ක් වූ නිල නිවාස 03 ක් හා ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලක් මාස 02 ත් වර්ෂ 08 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප කැබීම

මුදල් රෙගුලාසි අංක 880 (i) හි විධිවිධාන හා රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 අධිකාරිය ප්‍රකාරව ගබඩා නිලධාරීන් හා මුදල් භාර ගැනීම් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් යටෝක්ත රෙගුලාසියෙහි සඳහන් පරිදි ඇප තැන්පත් කර නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂ

2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් විශ්‍රාම ගිය හා වැඩ තහනමට ලක්වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.151,215 ක හා රු.330,234 ක ණය ශේෂයක් අයකර

ගැනීමට මේ දක්වා කටයුතු කර නොනිබුණි.

(ආ) වාහන අනතුරු හා චන්දි අයකර ගැනීම

i. අංක KR - 5851 දරන රථය 2025 ජූලි 08 දින රිය අනතුරකට ලක්වී තිබුණද මුදල් රෙගුලාසි 104(4) යටතේ අලාභයන් පිළිබඳව පූර්ණ වාර්තාව සකස් කර අලාභයන් තක්සේරු කර නොනිබුණි.

ii. අංක 19-9842 දරන රථය 2024 ජුනි 27 දින රිය අනතුරකට ලක්වී තිබූ අතර එම රථය අළුත්වැඩියා කර නොනිබුණු අතර අනතුරට අදාළව රක්ෂණ ආයතනයෙන් රක්ෂණ චන්දි මුදල් අයකර ගැනීමට 2026 අප්‍රේල් 30 දින දක්වා කටයුතු කර නොනිබුණි.

5. නිරසර සංවර්ධනය අරමුණු ලභා කර ගැනීම

නිරසර සංවර්ධනය පිලිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුළදී 2030 වර්ෂය වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති කොටස ඉහළ නැංවීම අරමුණු කරගෙන අලුතින් ඉදිකරනු ලබන හා නවීකරණය කරන රජයේ සියළුම ගොඩනැගිලි සූර්යය බලය උපයෝගී කර පුනර්ජනනීය බලශක්තිය උත්පාදනයට අදාළ පහසුකම්වලින් සමන්විතව ඒවායෙහි බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 25 ක් සපුරා ගැනීම ඉලක්ක කර තිබුණි. ඒ අනුව සූර්ය පැනල ස්ථාපිත කිරීමේ පහසුව හා ඉඩකඩ පුළුල් කිරීම, මූලික ගොඩනැගිලි සැලසුමෙහි අනිවාර්ය අංගයක් ලෙස නිර්ණායක සැකසීම, රජයේ සියළුම ගොඩනැගිලිවල බලශක්ති අවශ්‍යතාවයෙන් යම් පංගුවක් සූර්යය බලය උපයෝගී කරගෙන සපුරා ගත යුතු බවට නීති රෙගුලාසි පැනවීමට මූලිකවම දායකවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර නොනිබුණි.

සූර්යය පැනල සවි කිරීම් පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේදී ගොඩනැගිලි 02 ක සූර්යය පැනල සවි කිරීම සඳහා ඇස්තමේන්තු හා නිර්මාණ කටයුතු නිම කර තිබූ බවත් ගොඩනැගිලි 02 ක ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවීම් පමණක් කර තිබූ බවත් නිරීක්ෂණය විය. එක් ව්‍යාපෘතියක හෝ සූර්යය පැනල සවිකර විදුලි බල මණ්ඩලයට සම්බන්ධතාවය ලබා දී නොනිබුණි.

6. යහපාලනය

6.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම

2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (1) දරන වක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි

06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අනුව කොන්ත්‍රාත් බිල්පත් සඳහා ගෙවීම් සහතික නිකුත් කිරීමේදී අතරමැදි සහතිකය දින 21 ක් තුළද අවසන් සහතිකය දින 42 ක් තුළද නිකුත් කළ යුතු වුවත් කර්මාන්ත අමාත්‍යාංශයේ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට අදාළ අවසාන සහතිකය හා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ගුවණාගාරය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට අදාළ අතරමැදි සහතිකය, බිල්පත් ඉදිරිපත් කළ දින සිට ගිණුම් අංශයට ලබා දීමට පිළිවෙලින් දින 56 ක් හා දින 24 ක් ගත වී තිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය 638 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 478 ක් වූ බැවින් තනතුරු 160 ක ඌනතාවයක් පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු අතුරින් අධ්‍යක්ෂ (සැලසුම් ඉංජිනේරු), සහකාර අධ්‍යක්ෂ (පාලන), නීති නිලධාරි, ප්‍රධාන ඉංජිනේරු තනතුරු 02 ක්, ඉංජිනේරු තනතුරු 13 ක් හා ගෘහ නිර්මාණ ශිල්පි තනතුරු 4 ක් පුරප්පාඩුව පවතින අතර, ආයතනයේ කාර්යභාරය හා සෘජු පුරප්පාඩු පිරවීමට හෝ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

මට්ටම	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	ඌනතාවය
ජ්‍යෙෂ්ඨ	127	102	25
තෘතීයික	24	06	18
ද්විතියික	309	243	66
ප්‍රාථමික	178	127	51
එකතුව	**638**	**478**	**160**

වී.ඩී. සීතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 — කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තක්සේරු නිමැවුම්			
	100%- 90%	75%- 89%	50%- 74%	50 % ට වඩා අඩු
දළ රූප සටහන් නිර්මාණ	92.31%			
සැලසුම් සටහන් නිර්මාණය		88.2%		
සම්පූර්ණ කල ව්‍යාපෘති (ව්‍යාපෘති ගණන)		76%		
සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (ඉදිකිරීම්)			68%	
සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (නඩත්තු)	100%			
සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (ව්‍යාපෘති කළමනාකරණය)		88%		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

	අරමුණු	ඉලක්ක	දර්ශකය	ප්‍රගතිය
01	2025 වර්ෂයේ සේවාදායක ආයතන හා අප දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා හා කලාප කාර්යාලවල වහලේ වර්ග ප්‍රමාණය (Roof area) අනුව සූර්ය පැනල සඳහා පිරිවිතර හා දළ ඇස්තමේන්තු සකස් කර දීම - SDG 07	අලුතින් ඉදිකරනු ලබන හා නවීකරණය කරන රජයේ සියළුම ගොඩනැගිලි, සූර්ය බලය උපයෝගී කරගෙන පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කරන පහසුකම් වලින් සමන්විත වීම හා ඒවායින් බලශක්ති අවශ්‍යතාවයෙන් 25% ක් සපුරා ගැනීම	සැලසුම් සම්පූර්ණ කරනු ලබන ව්‍යාපෘති වලින් 40% ක් සඳහා අදාල පහසුකම් සහිත වීම.ගොඩනැගිල්ලේ සම්පූර්ණ බලශක්ති අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 10% ක් එමඟින් සපුරා ගැනීම	1. **ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බණ්ඩාරවෙල සංචාරක බංගලාව - 31.25%** සියලුම ඇස්තමේන්තු හා නිර්මාණ කටයුතු නිම කර ඇත. 2026 වසරේදී ක්‍රියාත්මක කරනු ලැබේ. **2. ප්‍රධාන ඉංජිනේරු (කලාප 03) කුරුණෑගල කාර්යාලය - 62.5%** සියලුම ඇස්තමේන්තු හා නිර්මාණ කටයුතු සිදුකර ඇත. 2025 වසරේදී සම්බන්ධතාවය ලබා දිය නොහැකි බව විදුලිබල මණ්ඩලය දැනුම් දී ඇත. **3. ප්‍රධාන ඉංජිනේරු (කලාප 06) ගාල්ල කාර්යාලය - 62.5%** සියලුම ඇස්තමේන්තු හා නිර්මාණ කටයුතු සිදුකර ඇත. 2025 වසරේදී සම්බන්ධතාවය ලබා දිය නොහැකි බව විදුලිබල මණ්ඩලය දැනුම් දී ඇත. **4. කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -33.33%** සියලුම ඇස්තමේන්තු හා නිර්මාණ කටයුතු නිම කර ඇත. 2026 වසරේදී ක්‍රියාත්මක කරනු ලැබේ.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවකයන් සංඛ්‍යාව	කොන්ත්‍රාත්/අනියම්	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	127	102	0	25
කෘතියික	24	6	0	18
ද්විතියික	309	243	0	66
ප්‍රාථමික	178	127	3	51
මුළු එකතුව	**638**	**478**	**3**	**160**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න.

- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් පුළුල් කාර්යය භාරයක් ඉටු කරන දෙපාර්තමේන්තුවක් වන අතර වර්තමානයේදී රජයේ ගොඩනැගිලි බොහොමයක නඩත්තු කටයුතු ද ඉටු කරනු ලබයි.
- එහිදී අවශ්‍ය වන තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමේදී බාධක මතුවේ.
- 2025/12/31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වන 638 න් සේවයේ නියුක්තව ඇත්තේ 478 ක් පමණි.
- අත්‍යාවශ්‍ය තාක්ෂණික ගණයේ තනතුරු හෝ පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය හා අනුයුක්ත කිරීම් ලැබුනේ නම් ව්‍යාපෘති කටයුතු මීට වඩා කාර්යක්ෂමව ඉටුකිරීමේ හැකියාව පැවතුනි.

6.3 මානව සම්පත් කළමනාකරණය

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් ඵලය
				දේශීය	විදේශීය		
1	KDK දැනුවත් කිරීමේ වැඩමුළුව	10	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
2	විදුලි තාක්ෂණ ශිල්පය	01	දින 01	5,000.00		දේශීය	
3	ඇලුමිනියම් නිෂ්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය	03	දින 01	15,000.00		දේශීය	
4	ජලනල තාක්ෂණ සම්මන්ත්‍රණය	03	දින 01	15,000.00		දේශීය	
5	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන	03	දින 04	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
6	වාර්තා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	18	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
7	කණ්ඩායම් වශයෙන් ජාතික ලේඛනාගාරය නැරඹීම	15	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
8	ව්‍යුහාත්මක දෝෂ, නිවැරදි කිරීම සහ අවම කිරීම	38	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
9	ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වල ආරවුල් විසඳීම	27	දින 01	150,000.00		දේශීය	
10	BOQ සකස් කිරීම සහ ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ ඇස්තමේන්තුගත නිරවද්‍යතාවය පිළිබඳ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන	96	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
11	ස්ටර්ලින් වානේ වහල පිළිබඳ තාක්ෂණික සැසිය	44	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
12	CIDA මිල උච්චාවචන සූත්‍රය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය	09	දින 01	45,000.00		දේශීය	
13	මූලික විමර්ශනය	01	දින 01	6,500.00		දේශීය	
14	ඉංජිනේරුවන් සහ තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන - ටෝකියෝ සිමෙන්ති	30	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
15	ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියේ (ePMS) සම්බන්ධීකරණය	01	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
16	"පොදු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සහ පිළිවෙත්" පිළිබඳ CPD පාඨමාලාව	01	දින 10	19,200.00		දේශීය	

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	මන්තව්‍ය/ලබා ගත් ආයතනය
				දේශීය	විදේශීය		
17	හරිත ප්‍රතීතනය සඳහා පුහුණු වැඩසටහන	01	දින 10	45,000.00		දේශීය	
18	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (NDMP) 2023-2030 පිළිබඳ සංවේදීකරණ වැඩමුළුව	01	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
19	ජගත් පරිසර දින සැමරීමේ වැඩසටහනට සමගාමීව " ප්ලාස්ටික් දූෂණය අවසන් කිරීම " යන ගෝලීය තේමාව යටතේ දැනුවත් කිරීමේ දේශනය	10	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
20	අත්තිකාරම් පුද්ගල ආදායම් බදු පිළිබඳව නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන	03	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
21	විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම	01	දින 01	6,000.00		දේශීය	
22	ව්‍යාපාර පරිපාලනවේදී (MBA) උපාධි වැඩසටහන - 2025	01	වසර 02	245,000.00		දේශීය	
23	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MPFM) උපාධි වැඩසටහන	01	වසර 01	90,000.00		දේශීය	
24	ඇලුමිනියම් ව්‍යාපෘතිවල EPDM රබර් පැතිකඩ පිළිබඳ කෙටි දැනුවත් කිරීමේ වැඩසටහන	40	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
25	ඇලුමිනියම් නිෂ්පාදනය සහ කර්මාන්තශාලා දැක්ම පිළිබඳ	30	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
26	වානේ සහ කොන්ක්‍රීට් ව්‍යුහයන් යුරෝ කේත (Euro code) වලට අනුව සැලසුම් කිරීමේ සම්මන්ත්‍රණය	03	දින 08	75,000.00		දේශීය	
27	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය	01	දින 01	6,500.00		දේශීය	
28	2025 IESL වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය	01	දින 01	6,500.00		දේශීය	
29	ජනක යන්ත්‍ර, මෝටර්, වී.එෆ්.ඩී සහ සෝපාන පිළිබඳ තාක්ෂණික දැනුම බෙදා ගැනීමේ සැසිය	20	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
30	ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන	01	වසර 02	250,000.00		දේශීය	
31	හරිත ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	04	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	සටහන/ලබා ගත් ඇගැයීම
				දේශීය	විදේශීය		
32	"භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල වෙනස්කම්" පුහුණු වැඩසටහන	40	දින 01	26,910.00		දේශීය	
33	පිහිනුම් තටාක ජල ආරක්ෂණ සහ ටයිල් විසඳුම් පිළිබඳ තාක්ෂණික වැඩමුළුව	40	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
34	PA පද්ධතිය (ශ්‍රව්‍ය විසඳුම) පිළිබඳ DSPPA පුහුණු සැසියට පිළිබඳ වැඩමුළුව	6	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
35	සොකොමෙක් ATS පිළිබඳ වැඩමුළුව	3	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
36	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය	01	වසර 02	145,100.00		දේශීය	
37	අලුතින් බඳවා ගත් ඉංජිනේරු සේවා කැඩෙට් නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දර්ශන සඳහා පහසුකම් සැලසීම පිළිබඳ වැඩමුළුව	192	දින 01	101,300.00		දේශීය	
38	ගිනි ඔරොත්තු දෙන නිර්මාණය පිළිබඳ CPD වැඩසටහන	01	දින 01	8,500.00		දේශීය	
39	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැඩමුළුව 02	115	දින 01	95,775.00		දේශීය	
40	ජල ආරක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුව	04	දින 01	20,000.00		දේශීය	
41	නිපොන් පේන්ට් ලංකා (පුද්) සමාගම සමඟ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන	52	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
42	Dynnamic AV Technologies (PVT) Ltd විසින් MEP, ඉදිකිරීම් සහ අභ්‍යන්තර සංවිධාන සඳහා ධ්වනි විසඳුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	45	දින 01	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
43	ISO 9001: 2015 පුහුණු වැඩමුළුව	32	දින 03	272,086.19		දේශීය	
44	පහසුකම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	1	දින 06	40,000.00		දේශීය	
45	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය	1	වසර 01	20,000.00		දේශීය	

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	සිංහල/ ඉංග්‍රීසි
				දේශීය	විදේශීය		
46	ප්‍රසම්පාදනය හැඳින්වීම පිළිබඳ වැඩමුළුව	25	දින 01	14,000.00		දේශීය	
47	දෙමළ භාෂා පුහුණු වැඩසටහන	15	පැය 150	56,250.00		දේශීය	
48	දෙමළ භාෂා පුහුණු වැඩසටහන	15	පැය 150	10,000.00		දේශීය	
49	ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා වන 7 වන ධාරිතා වර්ධන වැඩසටහන	02	දින 12	-		විදේශීය	
50	ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව (JDS) ව්‍යාපෘතිය පශ්චාත් උපාධි වැඩසටහන	02	වසර 02	-		විදේශීය	
51	'පිරිසිදු නගර - වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම' යන මැයෙන් 5 වන ධාරිතා සංවර්ධන වැඩසටහන	02	දින 12	-		විදේශීය	
52	'පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: නාගරික පරිවර්තනය කිරීම ප්‍රාදේශීය භාවිතයන් සමඟ ශ්‍රී ලංකාව II' යන මැයෙන් 6 වන ධාරිතා සංවර්ධන වැඩසටහන	02	දින 12	-		විදේශීය	
	එකතුව	**1014**		**1,789,621.19**			

07- පරිච්ඡේදය— අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලතා දක්වයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලතා දක්වයි		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
I .5	විශේෂ අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	භාණ්ඩ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA –N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
03	**මූල්‍ය පාලනය සඳහා අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලතා දක්වයි		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූලතා දක්වයි		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනයට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූලතා දක්වයි		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලතා දක්වයි		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලතා දක්වයි		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලතා දක්වයි		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූලතා දක්වයි		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
9.2	වාහන ගර්හාත වී මාස 06 කට අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලතා දක්වයි		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලතා දක්වයි		
9.5	2016.12.29 දිනැති 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලතා දක්වයි		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලතා දක්වයි		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලතා දක්වයි		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලතා දක්වයි		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12. 1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලතා දක්වයි		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලතා දක්වයි		
13	**පොදු තැන්පත් ගිණුම**			
13. 1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලතා දක්වයි		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලතා දක්වයි		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලතා දක්වයි		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලතා දක්වයි		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලතා දක්වයි		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරුතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලතා දක්වයි		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හා වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාක්මක කර තිබීම	අනුකූලතා දක්වයි		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලතා දක්වයි		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	පුහුණු වියදම් ශීර්ෂය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලතා දක්වයි		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලතා දක්වයි		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලතා දක්වයි		

අවසානය